03
පාඩම
तृतीयः पाठः

# ව්‍යඤ්ජන ප්‍රභේද හඳුනා ගනිමු

*ස්වරයන්ගේ සහායෙන් තොර ව උච්චාරණය කළ නොහැකි අකුරු සමූහය "ව්‍යඤ්ජන" නම් වේ. ව්‍යඤ්ජන අක්ෂර මාලාවේ ප්‍රභේද පිළිබඳ තොරතුරු මෙහි දී ඔබට හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඒවා මැනවින් මතකයේ තබාගන්න.*

## व्यञ्जन (ව්‍යඤ්ජන)

සංස්කෘත ව්‍යඤ්ජනාක්ෂර ගණනින් (35) තිස්පහකි. ඒ මෙසේ ය.

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

සංස්කෘත භාෂාවේ ව්‍යඤ්ජන සමූහය කොටස් කීපයකට බෙදෙන අතර මෙම ශ්‍රේණියේ දී පහත සඳහන් කොටස් පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.

1 वर्गाक्षर (වර්ගාක්ෂර)

2 वर्गान्त (වර්ගාන්ත)

3 अनुस्वार (අනුස්වාර)

4 विसर्ग (විසර්ග)

මෙම ප්‍රභේද පිළිබඳ සවිස්තර තොරතුරු පහත දැක්වේ.

01. वर्गाक्षर (වර්ගාක්ෂර)

**क**කාරයේ සිට **म**කාරය දක්වා ඇති අකුරු 25 '**වර්ගාක්ෂර**' නම් වේ. ඒවා අකුරු (5) පහ බැගින් වර්ග පහකට (5) බෙදේ. ඒ ඒ වර්ග හඳුන්වන්නේ මුලට යෙදුණු අකුර අනුව යි. නිදසුන් :-

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| कवर्ग | - | क | ख | ग | घ | ङ |
| चवर्ग | - | च | छ | ज | झ | ञ |
| टवर्ग | - | ट | ठ | ड | ढ | ण |
| तवर्ग | - | त | थ | द | ध | न |
| पवर्ग | - | प | फ | ब | भ | म |

02. वर्गान्त (වර්ගාන්ත)

වර්ගාක්ෂරයන්ගේ අන්තයෙහි පිහිටි අක්ෂර වර්ගාන්ත වශයෙන් හැඳින්වේ.

නිදසුන් :-

ङ ञ ण न म

03. अनुस्वार (අනුස්වාර)

'ං' අනුස්වාර නම් වේ. එය ස්වරයකට පසුව යෙදී ඒ අනුව ශබ්ද වන බැවින් ඒ නම භාවිත වේ.

නිදසුන් :-

अं (අ)ං कं (ක)ං

04. विसर्ग (විසර්ග)

උඩ යට සිටින සේ යෙදෙන බින්දු දෙක '**විසර්ග**' නම් වේ. විසර්ග යනු පිට කිරීම යි. මුවින් වායුව වේගයෙන් පිට කරමින් ශබ්ද වන හෙයින් ඒ නම යෙදේ. විසර්ජනීය යනු ද මෙයට නමකි.

නිදසුන් :-

(अ)ः (අ)ඃ (क)ः (ක)ඃ

## 3.1 ක්‍රියාකාරකම

රූප දෙක බැගින් භාවිත වන අක්ෂර උගනිමු.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | अ<br>अ | ඍ | ऋ<br>ऋ | ඎ | ॠ<br>ॠ | ඛ | ख<br>ख |
| ඣ | झ<br>झ | ණ | ण<br>ण | ළ | ल<br>ल | ශ | श<br>श |

## 3.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ෂඩාශ්‍රයේ ඇතුළත් අක්ෂර පෙළගැස්ම නිවැරැදි ව වර්ගවලට බෙදා දක්වන්න.

क च ट
त प ख छ
ट थ फ ग ज ड
द ब झ ढ
ध भ ङ ञ
ण न म

2. පහත රවුමෙහි දක්වා ඇති ව්‍යඤ්ජන අතුරින් වර්ගාන්ත තෝරා ලියන්න.

क
ग ङ ड
ण त द थ
म य र झ
न छ ढ
ञ

## 3.2 අභ්‍යාසය

1. පළමු පේළියේ අක්ෂරයන්ට ගැළපෙන රූපයෙන් වෙනස්, සමාන අක්ෂර දෙවන පේළියෙන් තෝරා එහි ඉලක්කම යොදන්න.

| පළමු පේළිය | | | දෙවන පේළිය |
|---|---|---|---|
| 1. अ | → | 6 | 1. झ |
| 2. ऋ | → | ☐ | 2. ण |
| 3. ॠ | → | ☐ | 3. ल |
| 4. ख | → | ☐ | 4. श |
| 5. झ | → | ☐ | 5. ऋ |
| 6. ण | → | ☐ | 6. अ |
| 7. ल | → | ☐ | 7. ख |
| 8. श | → | ☐ | 8. ॠ |

2. පහත සඳහන් වචන අක්ෂර රූප දෙකම භාවිත කොට නාගරී අකුරින් ලියන්න.

උදා:- 1. අඛිල > अखिल → अखिल   2. ශිඛර > शिखर → शिखर

| | |
|---|---|
| 1. අනල | 7. ඍෂි |
| 2. ආකාශ | 8. මුඛ |
| 3. ඍණ | 9. ඣමපාක |
| 4. දක්ෂිණා | 10. ඎකාර |
| 5. ඣෂ | 11. ඛර්ජූරක |
| 6. ශිලා | 12. කෲපණ |

**භාවිතයට**

**क्षणशः कणशश्चैव - विद्यामर्थं च साधयेत्।**
**क्षणत्यागे कुतो विद्या - कणत्यागे कुतो धनम्॥**

මොහොතෙන් මොහොත ඉගෙනුම ද සතයෙන් සතය ධනය ද රැස් කරගන්නේ ය. මොහොතක් අත්හළොත් ඉගෙනුමක් කොයින් ද? සතයක් අත්හළොත් ධනයක් කොයින් ද?